Teachmore.lk

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව

### වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ III ශ්‍රේණියේ තනතුරුවලට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2026

කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් හා වාරිමාර්ග අමාත්‍යාංශය යටතේ පවතින වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ පහත සඳහන් තනතුරුවලට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය සඳහා සුදුසුකම් සපුරා ඇති ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. මෙම විභාගය, විභාග කොමසාරිස් ජනරාල් විසින් **2026 ඔක්තෝබර් මස කොළඹ දිස්ත්‍රික්කයේ දී** පවත්වනු ඇත. මෙම විභාගය කල් දැමීමට හෝ අවලංගු කිරීමට වාරිමාර්ග අධ්‍යක්ෂ ජනරාල්වරයාට බලය ඇත.

- ❖ අයදුම්පත ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ www.donets.lk වෙබ් අඩවියේ "Our Services" යටතේ ඇති "Online Applications – Recruitment Exams/E.B.Exams" ඔස්සේ පළ කර ඇති අතර අයදුම්පත් ඉදිරිපත් කළ හැක්කේ මාර්ගගත ක්‍රමයට (Online) පමණි. මාර්ගගත අයදුම්පත් භාර ගැනීම **2026 ජූලි මස 27 දින පෙ.ව. 9.00ට විවෘත වන අතර 2026 අගෝස්තු 25 වැනි දින ප.ව. 9.00 ට අවසන් වේ.**
- ❖ දැනට රාජ්‍ය /පළාත් රාජ්‍ය සේවයේ නියුතු නිලධාරින් අයදුම්පතේ පිටපතක් තම පෞද්ගලික ලිපිගොනුවට ඇතුළත් කිරීම සඳහා ආයතන ප්‍රධානියා වෙත භාර දිය යුතු අතර, සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලබන අවස්ථාවේ දී ආයතන ප්‍රධානියා විසින් සහතික කළ අයදුම්පතේ පිටපතක් සහ සේවය සනාථ කිරීමේ ලිපියක් ඉදිරිපත් කළ යුතු ය.
- ❖ අයදුම්පත් යොමු කිරීම අවසාන දිනය දක්වා ප්‍රමාද කිරීමෙන් ඇති වන ඕනෑම අහිතකර තත්ත්වයක් අයදුම්කරු විසින් විඳ දරාගත යුතු ය.

1.0 බඳවා ගැනීමට අපේක්ෂිත තනතුරු

| *අනු. අංකය* | *තනතුරු නාමය* | *පුරප්පාඩු සංඛ්‍යාව* | *බඳවා ගන්නා ශ්‍රේණිය* |
|---|---|---|---|
| 1. | සැලසුම් ශිල්පී | 91 | පුහුණු කිරීමේ ශ්‍රේණිය (එක් වසරක පුහුණුව සඳහා) |

| අනු. අංකය | තනතුරු නාමය | පුරප්පාඩු සංඛ්‍යාව | බඳවා ගන්නා ශ්‍රේණිය |
|---|---|---|---|
| 2. | විදුලි සහකාර | 06 | පුහුණු කිරීමේ ශ්‍රේණිය (දෙවසරක පුහුණුව සඳහා) |
| 3. | පර්යේෂණ සහකාර (සාමාන්‍ය) | 02 | |
| 4. | සිවිල් ඉංජිනේරුමය ද්‍රව්‍ය සමීක්ෂක | 13 | |
| 5. | පාංශු ප්‍රස්ථාරක | 02 | |
| 6. | ජල විද්‍යා සහකාර | 06 | |
| 7. | ජල විද්‍යා ක්ෂේත්‍ර සහකාර | 03 | |
| 8. | පර්යේෂණ සහකාර (ඉංජිනේරුමය ද්‍රව්‍ය) | 03 | |
| 9. | පස් සමීක්ෂක | 10 | |
| 10. | පර්යේෂණ සහකාර (ජල ශක්ති) | 03 | |
| 11. | යාන්ත්‍රික මූලික | 10 | III වන ශ්‍රේණියට බඳවා ගැනේ. එහෙත් බඳවා ගැනීමෙන් අනතුරුව මුල් මාස 06 තුළ වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ යාන්ත්‍රික වැඩපලක සේවාස්ථ පුහුණුවක් ලබා දෙනු ලැබේ. |

1.1. තනතුරුවල රාජකාරී ස්වභාවය

| අනු. අංකය | තනතුරු නාමය | පැවරෙන කාර්යයන් |
|---|---|---|
| 1. | සැලසුම් ශිල්පී | (1) ඉංජිනේරු කාර්ය මණ්ඩලය විසින් දෙනු ලබන නිර්මාණ සටහන්, මූලික පරාමිති, කෙටුම්පත් සටහන් ඇසුරෙන් විස්තරාත්මක සැලසුම්පත් පිළියෙල කිරීම/ පරීක්ෂා කිරීම : බිම් මැනුම් තලමිති මැනුම් ආශ්‍රයෙන් පිඹුරුපත්, සමෝච්ච රේඛා සිතියම්, දික්කඩ හරස්කඩ සැලසුම්පත් පිළියෙල කිරීම/පරීක්ෂා කිරීම, වාරිමාර්ග ව්‍යාපාරවල ඉඩම් කට්ටි කිරීමේ සැලසුම්පත්, ඉඩම් පවරා ගැනීමේ සැලසුම්පත්, මෙහෙයුම් නඩත්තු සැලසුම්පත් ආදිය පිළියෙල කිරීම/ පරීක්ෂා කිරීම.<br><br>(2) ප්‍රමාණ ගණනය : ගාස්තු සඳහා මිල විශ්ලේෂණය : ප්‍රමාණ බිල්පත් පිළියෙල කිරීම/ පරීක්ෂා කිරීම<br><br>(3) වැඩ ඇස්තමේන්තු පරීක්ෂා කිරීම. වැඩ ඇස්තමේන්තු අනුසාරයෙන් ප්‍රසම්පාදන ක්‍රියාවලියට අදාළ පෝරම, උප ලේඛනය පිළියෙල කිරීම/ පරීක්ෂා කිරීම : වැඩ සඳහා ගෙවීම් කිරීමට අදාළ මිනුම් පොත්, ගෙවීම් බිල්පත්, අවසන් ගෙවීම් වාර්තා හා සැලසුම්පත් පරීක්ෂා කිරීම.<br><br>(4) වාරිමාර්ග ව්‍යාපාරවල තාක්ෂණික මෙහෙයුම් හා මනා දත්ත පිළිබඳ ලේඛන නඩත්තුව : ප්‍රගති වාර්තා සටහන් පිළියෙල කිරීම/පරීක්ෂා කිරීම.<br><br>(5) සැලසුම්පත්, පිඹුරුපත් සහ අනෙකුත් සැලසුම් කාර්යාලීය ලේඛන ද්‍රව්‍ය හා උපකරණවල භාරකාරත්වය හා නඩත්තුව.<br>විධායකය/ කළමනාකරණය විසින් පවරනු ලබන අනෙකුත් සැලසුම් ශිල්පීමය රාජකාරී |

Teachmore.lk



| අනු. අංකය | තනතුරු නාමය | පැවරෙන කාර්යයන් |
|---|---|---|
| 2. | විදුම් සහකාර | • මධ්‍යම හා මහා පරිමාණ ඉදිකිරීම් සඳහා භූමියේ ශක්තිමත්භාවය, භූගත ජල කාන්දුවීම් ආදිය පරීක්ෂා කිරීමේ කටයුතු.<br>• විශාල ඉදිකිරීම්වල අත්තිකාරම් සඳහා විවිධ ගැඹුරු මට්ටම්වලින් පාෂාණ හා පස් තට්ටුවල සාම්පල ලබා ගැනීම.<br>• පාෂාණ ස්ථරවල කාන්දුවීම නැවැත්වීම හා ඒවා ශක්තිමත් කිරීමට අවශ්‍ය කටයුතු කිරීම.<br>• නිම කරන ලද ඉදිකිරීම්වල සිමෙන්ති හා රසායනික ද්‍රව්‍ය කාවැද්දීම මඟින් ද මතුපිට යන්ත්‍ර මඟින් කොන්ක්‍රීට් ආස්තරණ යෙදීම මඟින් ද ජල කාන්දුවීම හා වෙනත් දුර්වලතාවලට පිළියම් යොදා ශක්තිමත් කිරීමේ කටයුතු කිරීම.<br>• ඉහත කාර්යයන්ට අදාළ වාර්තා ඉදිරිපත් කිරීම.<br>ඉහත කාර්යයන්ට අවශ්‍ය වන විදුම් යන්ත්‍ර, ජල පොම්ප හා වෙනත් උපකරණ ද ඒවාට අදාළ ඩීසල් හා පෙට්‍රල් යන්ත්‍ර ක්‍රියාකරවීම, නඩත්තු කිරීම හා අලුත්වැඩියා කිරීම. |
| 3. | පර්යේෂණ සහකාර (සාමාන්‍ය) | (1) දැනට කෙරෙමින් පවතින හා ඉදිරියේදී ක්‍රියාත්මක කිරීමට බලාපොරොත්තු වන වාරිමාර්ග හා වෙනත් සංවර්ධන ව්‍යාපෘතිවල ශක්‍යතා අධ්‍යයන කටයුතු සඳහා අවශ්‍ය වන පස් හා ජල සාම්පලවල භෞතික හා රසායන ගතිගුණ නිර්ණය සඳහා විශ්ලේෂණ කිරීම.<br>(2) ද්‍රාවන හා ප්‍රතිකාරක නිරවද්‍ය ලෙස පිළියෙල කිරීම, එදිනෙදා විශ්ලේෂණ කාර්යන්හිදී භාවිත වන නවීන සූක්ෂම ඉලෙක්ට්‍රොනික් විද්‍යුත් හා විද්‍යුත් යාන්ත්‍රික උපකරණ නිසි ලෙස භාවිත කිරීම, නිරවද්‍යව අංක ශෝධනය කිරීම හා මැනවින් නඩත්තු කිරීම, විශ්ලේෂණ මඟින් ලබා ගන්නා දත්ත සම්පාදනය කිරීම. |
| 4. | සිවිල් ඉංජිනේරුමය ද්‍රව්‍ය සමීක්ෂක | වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ වාරි ව්‍යාපෘති ඉදිකිරීම් සඳහා අවශ්‍ය ඉංජිනේරුමය ද්‍රව්‍ය සමීක්ෂණ කටයුතු කිරීම, එම ක්ෂේත්‍රයේ ඉංජිනේරුමය ද්‍රව්‍ය සඳහා තත්ත්ව පාලන කටයුතුවල (පස් සහ කොන්ක්‍රීට් ද්‍රව්‍යන්හි ගතිගුණ හා ශක්තීන් පිළිබඳ) නිරතවීම හා එම ප්‍රමිතීන් සහතික කිරීම.<br>රාජ්‍ය හා පුද්ගලික ආයතනවල ඉල්ලීම මත කෙරෙන ඉදිකිරීම් කටයුතු සඳහා අවශ්‍ය ඉංජිනේරුමය ද්‍රව්‍ය පර්යේෂණ කටයුතුවල නිරතවීම. |
| 5. | පාංශු ප්‍රස්ථාරක | • පාංශු සමීක්ෂණ හා පාංශු පරිශීලන සිතියම් ඒකාබද්ධ කිරීම හා රාශිභූත කිරීම.<br>• ලබා දෙන්නා වූ දත්ත ආශ්‍රයෙන් සිතියම් ඇඳීම හා සිතියම් වර්ණ ගැන්වීම.<br>• දළ පාංශු සිතියමට (Draft Soil Map) පාංශු සිතියම (Final Soil Map) පිළියෙල කිරීම.<br>• ගුවන් ඡායාරූප, ඉංජිනේරු මිනුම්පත් ආදිය ඇසුරෙන් ඉඩම් වර්ගීකරණ පාංශු හා ඉඩම් පරිහරණය ආදී සිතියම් පිළියෙල කිරීම, සිතියම් වර්ණ කිරීම හා ක්ෂේත්‍ර ඵලයන් ගණනය කිරීම, සිතියම් විශාල කර ඇඳීම සහ කුඩා කර ඇඳීම, විවිධ පස් පැතිකඩ හූ දර්ශන ඇඳීම, මෙම අංශයෙන් නිකුත් කළ වාර්තාවලට රූප සටහන් ප්‍රස්ථාර ආදිය ඇඳීම, වර්ණ සිතියම් නිෂ්පාදනයට අවශ්‍ය දෑ පිළියෙල කිරීම.<br>• පරිගණක ආශ්‍රිත මෘදුකාංග භාවිතයෙන් පාංශු සිතියම් පිළියෙල කිරීම. |

Teachmore.lk



| *අනු. අංකය* | *තනතුරු නාමය* | *පැවරෙන කාර්යයන්* |
|---|---|---|
| 6. | ජල විද්‍යා සහකාර | ශ්‍රී ලංකාවේ දිවයින පුරා ජල ද්‍රෝණි හා ජලාශ ආශ්‍රිතව එක් රැස් කර ගන්නා වූ මූලික ජල විද්‍යාත්මක හා කාලගුණික දත්ත, විද්‍යාත්මක සිද්ධාන්ත ප්‍රායෝගිකව උපයෝගී කොට ගෙන ජල විද්‍යාත්මක අවශ්‍යතාව සඳහා ගණනය කිරීම, විශ්ලේෂණය කිරීම, දත්ත පරිගණකගත කිරීම, පරිගණක භාවිතයෙන් විශ්ලේෂණය කිරීම, දෛනික, මාසික, වාර්ෂික හා දිගුකාලීන වාර්තා පිළියෙල කිරීම හා පවත්වාගෙන යාම, මහජනතාවට හා අදාළ ආයතනවලට එම තොරතුරු පිළියෙල කිරීම.<br><br>• එක් රැස් කර ගන්නා ජල විද්‍යාත්මක හා කාලගුණ දත්තවල නිරවද්‍යතාව ආරක්ෂා කිරීම හා ගුණාත්මකභාවය අධීක්ෂණය කිරීම සහ සහතික කර දත්ත බැංකුව නිරතුරුව පවත්වාගෙන යාම.<br>• ගංගාවල ගංවතුර මට්ටම ඉහළ යාම නිර්ණය කිරීම සඳහා අවශ්‍ය දත්ත ලබාගෙන පරිගණකගත කිරීම හා නව ගණිතමය මාදිලි භාවිතයෙන් ගංවතුරට ලක්විය හැකි ප්‍රදේශ අධ්‍යයන කිරීම.<br>• ක්ෂේත්‍ර පරීක්ෂණ මඟින් ගංවතුර හානි මට්ටම් හා එම හානිවලට ලක්විය හැකි ප්‍රදේශ මිනුම්ගත කිරීම හා සිතියම් ගත කිරීම.<br>• එම ප්‍රධාන ගංගාවල එවැනි ගංවතුරක් ඇතිවිය හැකි හෝ ඊට ආසන්න වන සෑම අවස්ථාවකදීම එම දත්ත නිරතුරුවම ලබා ගැනීම හා ඒ අනුව අනතුරු ඇඟවීම. |
| 7. | ජල විද්‍යා ක්ෂේත්‍ර සහකාර | ජල විද්‍යා අංශය මගින් තෝරා ගත් ගංගා නිම්න සඳහා ජල විද්‍යා ක්ෂේත්‍ර මිනුම් ඒකක පවත්වා ගෙන යාම හා අවශ්‍ය වන කාලගුණ දත්ත, වර්ෂාපතනය, ගංගාවල ගලා යන ජල මට්ටම සහ අවට ඇති වැව්වල ජල ධාරිතාවන්හි වෙනස්වීම් ආදිය පිළිබඳ දත්ත එක් රැස් කිරීම.<br><br>• එසේ ලබා ගන්නා ලද සියලුම ජල විද්‍යා හා කාලගුණ දත්ත පරීක්ෂා කර ලේඛන ගත කිරීම සඳහා මාසය අවසානයේ දී ප්‍රධාන කාර්යාලට ඉදිරිපත් කිරීම.<br>• ගංගාවල හා අතු ගංගාවල එම ජල මට්ටම පවතින අවස්ථාවල දී ගලා යන ජල ධාරිතාව මිනුම් ගැනීම.<br><br>ගංවතුර අනතුරක් ඇති විය හැකි අවස්ථාවලදී හෝ ඊට ආසන්න අවස්ථාවේදී ඒ සඳහා අනතුරු ඇඟවීම අවශ්‍ය වන ක්ෂේත්‍ර දත්ත නිරතුරුවම ප්‍රධාන කාර්යාලයට වාර්තා කිරීම, ප්‍රධාන ගංවතුර අවස්ථාවල දී එම වේලාවන් සමග ගංවතුර මට්ටම් වෙනස්වීම් සටහන් කර ගැනීම. |
| 8. | පර්යේෂණ සහකාර (ඉංජිනේරුමය ද්‍රව්‍ය) | වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ වාරි ව්‍යාපෘති ඉදිකිරීම් සඳහා අවශ්‍ය ඉංජිනේරුමය ද්‍රව්‍යවල යෝග්‍යතාව පිළිබඳව දී ඇති පිරිවිතරවලට අනුව පර්යේෂණ කටයුතුවල නිරත වීම හා පර්යේෂණාත්මක සාධක මත ප්‍රමිතීන් සහතික කිරීම, එම ක්ෂේත්‍රයේ ඉංජිනේරුමය ද්‍රව්‍ය සඳහා තත්ත්ව පාලන කටයුතුවල (පස් සහ කොන්ක්‍රීට් ද්‍රව්‍යයන්හි ගතිගුණ හා ශක්තීන් පිළිබඳ) සේවයේ අවශ්‍යතාව මත නිරත වීම.<br><br>රජයේ හා පුද්ගලික ආයතනවල ඉල්ලීම් මත කෙරෙන ඉදිකිරීම් කටයුතු සඳහා අවශ්‍ය ඉංජිනේරුමය ද්‍රව්‍ය පර්යේෂණ කටයුතුවල නිරත වීම හා එම ප්‍රමිතීන් සහතික කිරීම. |
| 9. | පස් සමීක්ෂක | (1) දැනට කෙරෙමින් පවතින හා ඉදිරියේදී ක්‍රියාත්මක කිරීමට බලාපොරොත්තු වන වාරිමාර්ග හා වෙනත් සංවර්ධන ව්‍යාපෘති මෙම අංශය මගින් සිදු කරනු ලබන පස් සමීක්ෂණ කටයුතු ඉඩම් පරිහරණ කටයුතු සඳහා අවශ්‍ය වන ක්ෂේත්‍ර දත්ත හා අනෙකුත් දත්ත ලබා ගැනීම සහ අන්තර්ජාතික වර්ගීකරණයට අනුකූලව එක් එක් පස් වර්ග වර්ගීකරණය කිරීම.<br>(2) පස නිර්මාණය වීමේ සාධක (දේශගුණය, භූ විෂමතාව, භූ විද්‍යාත්මක කරුණු යනාදිය) සැලකිල්ලට ගනිමින් ඒ ඒ පාංශු ගණ හෝ ශ්‍රේණිවල පිහිටීම හා පැතිරීම තීරණය කිරීම. |

| අනු. අංකය | තනතුරු නාමය | පැවරෙන කාර්යයන් |
|---|---|---|
| | | (3) අන්තර්ජාතික සම්මතයන්ට අනුකූලව පාංශු පැතිකඩයන්හි සවිස්තරාත්මක සටහනක් සකස් කිරීම සඳහා අවශ්‍ය වන පරිද්දෙන් පාංශු නියැදි ලබා ගැනීම. එම පාංශු නියැදි විශ්ලේෂණය සඳහා රසායානාගාරයට භාර දීම, එම විශ්ලේෂණ දත්ත හා ක්ෂේත්‍ර නිරීක්ෂණ දත්ත පදනම් කරගනිමින් අවසාන පාංශු සිතියම්හි නිරවද්‍යතාව තහවුරු කරගැනීම සහ පාංශු යතුර පිළියෙල කර ගැනීම.<br>(4) අදාළ ප්‍රදේශවල ගුවන් ඡායාරූප ත්‍රිමානේක්ෂය උපයෝගී කරගනිමින් ගුවන් ඡායාරූප විශ්ලේෂණය කිරීම.<br>(5) දත්ත අවශ්‍ය වන තීව්‍රතාව අනුව පාංශු සමීක්ෂණ කටයුතු සිදු කර ක්ෂේත්‍ර දත්ත ලබා ගැනීම, පස් පැතිකඩ අනුව පස් වර්ග හඳුනාගැනීම.<br>(6) ක්ෂේත්‍රයේදී ලබාගන්නා වූ නිරීක්ෂණ දත්ත මත දළ පාංශු සිතියම (Draft Soil Map) පිළියෙල කිරීම සහ පෙන්ටොග්‍රාස් යන්ත්‍රය භාවිත කරමින් අවශ්‍ය පරිමාණයට සකස් කිරීම.<br>(7) ක්ෂේත්‍රයේදී ලබාගන්නා වූ නිරීක්ෂණ දත්ත හා අන්තර්ජාලය උපයෝගී කරගෙන ඉඩම් පරිහරණ සිතියම් පිළියෙල කිරීම.<br>(8) ජී.පී.එස්. (ජී.පී.එස් - Global Position System) උපකරණ මඟින් දත්ත ලබාගැනීම.<br>(9) පසේ ජල සන්නායකතාව පිළිබඳ දත්ත ලබා ගැනීම.<br>(10) ක්ෂේත්‍රයේදී ක්ෂේත්‍ර කම්කරු මුරකරු සහ රියදුරන්ගේ පාලන කටයුතු (අධීක්ෂණ කටයුතු) සිදු කිරීම සහ ඔවුන්ගේ මූල්‍යමය රාජකාරී කටයුතු සෘජුවම සිදු කිරීම |
| 10. | පර්යේෂණ සහකාර (ජල ශක්ති) | ජල ශක්ති අංශයේ ඉංජිනේරුවරුන්ගේ කටයුතුවලට සහාය වීම, ජල ශක්ති අංශයට අදාළ ඉදිකිරීම් වැඩවලට සියලුම ක්ෂේත්‍ර කටයුතු උපකරණ, ද්‍රව්‍ය, කම්කරු පාලනය, ජලශක්ති ආදර්ශන මෙහෙය වීම, ගොඩනැගිලි හා අනෙකුත් යටිතල පහසුකම් නඩත්තුව, ජල ශක්ති අංශයේ ඉදිකිරීම් වැඩවලට අදාළ ඇස්තමේන්තු, සැලසුම්පත් සකස් කිරීම, දෙපාර්තමේන්තුවට අදාළ සියලුම යාන්ත්‍රික හා ඉලෙක්ට්‍රොනික උපකරණ අලුත්වැඩියාවන්ට සම්බන්ධ වීම, එම උපකරණ මිලදී ගැනීමට අදාළ පිරිවිතර සකස් කිරීම සහ ඒවා මිලදී ගැනීමේදී හා තත්ත්ව වාර්තා සකස් කිරීමේදී අදාළ කටයුතුවලට සහාය වීම. |
| 11. | යාන්ත්‍රික මූලික | සුළු සේවකයන් පාලනය කිරීමේදී සහ රථ වාහන, යන්ත්‍ර ආදිය සඳහා ලදුපත් පිළියෙල කිරීමේදී යාන්ත්‍රික ඉංජිනේරුවරයාට සහාය වීම, තාක්ෂණ සහායක (යාන්ත්‍රික) හෝ වැඩ ලිපිකරු සමඟ වැඩ ආරම්භ කිරීම, ගබඩා භාරකරු නොමැති අවස්ථාවලදී අලුත්වැඩියාව සඳහා පැමිණෙන අයිතමයන් තමන් භාරයට ගැනීම, අලුත්වැඩියා කිරීම සඳහා අවශ්‍ය අමතර කොටස් ආයුධ සහ ද්‍රව්‍ය ආදිය ලබා ගැනීම, ගබඩා පොත් නඩත්තු කිරීම, ඇස්තමේන්තු පිළියෙල කිරීමේදී යාන්ත්‍රික ඉංජිනේරුවරයාට සහාය වීම, අලුත්වැඩියා කිරීමෙන් පසු නිසි පරිදි ආපසු භාර දීම සහ අබලි අමතර කොටස් ද්‍රව්‍ය සහ භාණ්ඩ ආපසු ගබඩාවට භාරදීම කරන ලද අලුත්වැඩියාවන් ලොග් පොත්වල ඇතුළත් කිරීම, තාක්ෂණ සහායක (යාන්ත්‍රික) හෝ පිරිවැය ලිපිකරු සමඟ මුළු පිරිවැය (බිල්පත්) පිළියෙල කිරීම, පාවිච්චි කරන ලද අමතර කොටස් ඉන්ධන ලිහිසි තෙල් සහ අනෙකුත් දේ වෙනුවෙන් ද්‍රව්‍ය වාර්තාව ඉදිරිපත් කිරීම.<br><br>අලුත්වැඩියාවලට යාන්ත්‍රික වැඩපොලට රැගෙන එන යන්ත්‍ර හා වාහන, ගබඩා භාරකරුගෙන් යාන්ත්‍රික වැඩපොලට භාරගෙන, අලුත්වැඩියාව නිම වීමෙන් පසු නැවත ගබඩා භාරකරු වෙත භාර දීම. |

2. බඳවා ගැනීමේ ක්‍රමය :

2.1. විභාග කොමසාරිස් ජනරාල් විසින් පවත්වනු ලබන ලිඛිත තරග විභාගයේ සහ සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයේ ප්‍රතිඵල මත බඳවා ගනු ලැබේ. ලිඛිත විභාගය සමත් අයදුම්කරුවන්ගේ මුළු ලකුණුවල කුසලතා අනුපිළිවෙළ අනුව බඳවා ගැනීමට අපේක්ෂිත සංඛ්‍යාවට සමාන සංඛ්‍යාවක් සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයට භාජනය කර සුදුස්සන් තෝරා ගනු ලැබේ.

2.2. සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය අයදුම්කරුවන්ගේ ශාරීරික යෝග්‍යතාව හා සහතික පත්‍ර පරීක්ෂා කර බැලීම සඳහා වන අතර, සම්මුඛ පරීක්ෂණයට ලකුණු ලබා දෙනු නොලැබේ.

2.3. වාරිමාර්ග අධ්‍යක්ෂ ජනරාල්ගේ එකඟතාව ලද පසු විභාගයට පෙනී සිටි සියලුම අයදුම්කරුවන් වෙත පෞද්ගලිකව හෝ මාර්ගගතව හෝ ප්‍රතිඵල නිකුත් කරනු ලැබේ.

3. වැටුප් පරිමාණය :

පුහුණු කිරීමේ ශ්‍රේණිය - රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 10/2025(I) හි උපලේඛන VI අනුව මාසික දීමනාවක් ගෙවනු ලැබේ.

III වන ශ්‍රේණිය - රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 10/2025 හි උපලේඛන II අනුව මෙම තනතුරට අදාළ මාසික වැටුප් පරිමාණය රු. 52,250-10X800-11X1,190-10X1,320-10X1,350- 1,00,040/- වේ. ( MN3 -2025)

4. සේවා ගණය - අධීක්ෂණ කළමනාකරණ සහකාර තාක්ෂණික

4.1. ශ්‍රේණි - III ශ්‍රේණිය
II ශ්‍රේණිය
I ශ්‍රේණිය

4.2. තනතුරෙහි ස්වභාවය - මෙම පත්වීම ස්ථිරය, විශ්‍රාම වැටුප් සහිතය. විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳව රජය විසින් ඉදිරියේ දී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයන්ට යටත් විය යුතුය.

5. සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි හා සේවා කොන්දේසි -

5.1. පුහුණු කිරීමේ ශ්‍රේණියට ඇතුළත් කර ගනු ලබන අයදුම්කරුවන් අදාළ පුහුණු කාලසීමාව සාර්ථක ලෙස සම්පූර්ණ කිරීමෙන් අනතුරුව වාරිමාර්ග අධ්‍යක්ෂ ජනරාල් විසින් පවත්වනු ලබන විභාගය සමත් බවට නිකුත් කරනු ලබන සහතිකය ඉදිරිපත් කිරීමෙන් පසුව පමණක් සේවයේ III ශ්‍රේණියට බඳවා ගනු ලැබේ.

5.2. පුහුණුව අවසානයේ පවත්වනු ලබන විභාගය සමත් වීමට අපොහොසත් වන ආධුනිකයන් වෙතොත් ඔවුනට මාස 06 කට නොවැඩි කාලයක් සඳහා සිය පුහුණු කාලය දීර්ඝ කරවා ගැනීමට අවස්ථාව ඇත. එසේ දීර්ඝ කරනු ලබන කාලසීමාව අවසානයේ නැවත පවත්වනු ලබන විභාගය අසමත් වන ආධුනිකයන්ගේ සේවය අවසන් කරනු ලැබේ.

5.3. III ශ්‍රේණියේ පත්වීම අවුරුදු 03 ක පරිවාස කාලයකට යටත් වේ. III වන ශ්‍රේණියට බඳවා ගෙන වසර 03 ක් ඇතුළත පළමුවැනි කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් විය යුතුය. එසේ නොවන්නේ නම් තනතුරෙහි සේවය අවසන් කරනු ලැබීමට යටත් විය යුතුය.

5.4. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 18/2020 හා ඊට අනුශාංගික චක්‍රලේඛ අනුව අදාළ මට්ටමේ භාෂා ප්‍රවීණතාව නියමිත කාලය තුළ ලබාගැනීම අනිවාර්ය වේ.

5.5. රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යපටිපාටික රීතිවලට ද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයට ද, මුදල් රෙගුලාසි සංග්‍රහයට ද, දෙපාර්තමේන්තුගත අනෙකුත් නියෝගවලට ද මෙම පත්වීම යටත් වේ.

5.6. තෝරාගනු ලබන අයදුම්කරුවන් දිවයිනේ ඕනෑම ප්‍රදේශයක පිහිටි ක්ෂේත්‍රයේ වැඩබිම්වල සේවයේ යෙදීමට හැකියාව තිබිය යුතු ය.

6. වයස් සීමාව :
අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට අවම වයස අවුරුදු 18 ට නොඅඩු විය යුතු අතර, උපරිම වයස අවුරුදු 30 ට නොවැඩි විය යුතු ය.

(ඒ අනුව 2008.08.25 දිනට හෝ ඊට පෙර හා 1996.08.25 දිනට හෝ ඊට පසු උපන්දිනය යෙදී ඇති අයට පමණක් මේ සඳහා අයදුම් කිරීමට සුදුසුකම් ඇත.)

7. අවශ්‍ය සුදුසුකම් :

7.1. අධ්‍යාපන සුදුසුකම්

7.1.1. සිංහල/ දෙමළ/ ඉංග්‍රීසි භාෂාව, විද්‍යාව, ගණිතය සහ තවත් එක් විෂයයකට සම්මාන සහිතව විෂයයන් හය (06) කින් අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය දෙවරකට නොවැඩි වාර ගණනකදී සමත්ව තිබීම;

*සහ*

**7.1.2. සැලසුම් ශිල්පී, විදුම් සහකාර, සිවිල් ඉංජිනේරුමය ද්‍රව්‍ය සමීක්ෂක, පාංශු ප්‍රස්ථාරක, ජල විද්‍යා සහකාර, ජල විද්‍යා ක්ෂේත්‍ර සහකාර, පර්යේෂණ සහකාර (ඉංජිනේරුමය ද්‍රව්‍ය), පර්යේෂණ සහකාර (ජල ශක්ති), යාන්ත්‍රික මූලික යන තනතුරු සඳහා**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේදී ව්‍යවහාරික ගණිතය / ශුද්ධ ගණිතය / සංයුක්ත ගණිතය, රසායන විද්‍යාව සහ භෞතික විද්‍යාව සහිතව විද්‍යා විෂයයන් තුනකින් (03) එකවර සමත්ව තිබීම

**7.1.3. පර්යේෂණ සහකාර (සාමාන්‍ය) සහ පස් සමීක්ෂක තනතුරු සඳහා**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේදී රසායන විද්‍යාව, භෞතික විද්‍යාව සහ තවත් එක් විද්‍යා හෝ ගණිත විෂයය සහිතව විද්‍යා විෂයයන් තුනකින් (03) එකවර සමත්ව තිබීම.

7.2. වෘත්තීය සුදුසුකම්

සැලසුම් ශිල්පී තනතුර සහ යාන්ත්‍රික මූලික තනතුර සඳහා ඉහත 7.1 හි සඳහන් අධ්‍යාපන සුදුසුකම්වලට අමතරව පහත සඳහන් වෘත්තීය සුදුසුකම් තිබිය යුතුය.

**සැලසුම් ශිල්පී**

තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන කාර්මික විද්‍යාලයක සැලසුම් ශිල්පය පිළිබඳ එක් අවුරුදු පූර්ණ කාලීන පුහුණු පාඨමාලාව සාර්ථකව සම්පූර්ණ කර අදාළ සහතිකය ලබා තිබීම.

**යාන්ත්‍රික මූලික**

I. මොරටුව විශ්ව විද්‍යාලය හෝ අම්පාර හාඩි ආයතනය විසින් පිරිනමනු ලබන ජාතික තාක්ෂණික ඩිප්ලෝමාව;

*හෝ*

II. ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය විසින් පිරිනමනු ලබන ඉංජිනේරු විද්‍යා ජාතික ඩිප්ලෝමාව;

*හෝ*

III. අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් පිරිනමනු ලබන ජාතික උසස් ඉංජිනේරු ඩිප්ලෝමාව;

*හෝ*

IV. ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය විසින් පිරිනමනු ලබන තාක්ෂණික ඩිප්ලෝමාව ලබා තිබීම;

හෝ

V. ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය විසින් පවත්වනු ලබන ඉංජිනේරු විභාගයේ I වන කොටස සාර්ථකව සම්පූර්ණ කිරීම;

*හෝ*

VI. රැකියා ක්ෂේත්‍රයට අදාළව ජාතික වෘත්තීය කුසලතා (NVQ) 06 මට්ටමේ සුදුසුකම් සම්පූර්ණ කර තිබීම;

*හෝ*

VII. උසස් අධ්‍යාපන අමාත්‍යාංශය සහ ඉහත සඳහන් තාක්ෂණ සහතික නිකුත් කරන ආයතනවලින් විමසා අදහස් ලබා ගැනීමෙන් අනතුරුව ඉහත සඳහන් තාක්ෂණික සුදුසුකම්වලට සියලු අතින් සමාන යැයි තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන වෙනත් තාක්ෂණික සුදුසුකම් ලබා තිබීම.

7.3. කායික සුදුසුකම්:

සෑම අයදුම්කරුවකුම ශ්‍රී ලංකාව තුළ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට හා තනතුරේ රාජකාරී ඉටු කිරීමට ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවකින් යුක්ත විය යුතු ය.

7.4. වෙනත් සුදුසුකම් :

I. ශ්‍රී ලංකාවේ පුරවැසියකු විය යුතු ය.
II. අයදුම්කරුවන් විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතු ය.
III. යම් ආගමික නිකායක පැවිදිවරයක් දරන කිසිදු තැනැත්තකු මෙම විභාගය සඳහා පෙනී සිටීමට සුදුසුකම් නොලබයි.
IV. සේවයට බඳවා ගැනීම සඳහා වන තරග විභාගයට පෙනී සිටීම සඳහා අවශ්‍ය සුදුසුකම් සපුරා ඇති ලෙසට පිළිගනු ලබන්නේ අයදුම්කරු අදාළ සියලු සුදුසුකම් හා නියමිත වයස් සීමාව අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සඳහන් කරනු ලබන දිනට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබෙන්නේ නම් පමණි.

8. විභාග පරිපාටිය :

විභාගය විෂයයන් දෙකකින් යුත් ලිඛිත පරීක්ෂණයකි. මෙම විභාගය සිංහල සහ දෙමළ මාධ්‍යවලින් පැවැත්වෙන අතර ඉල්ලුම් කරන මාධ්‍ය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

| *ප්‍රශ්න පත්‍රය/විෂය ක්ෂේත්‍රය* | *කාලය* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *සමත් ලකුණු ප්‍රමාණය* |
|---|---|---|---|
| 1. බුද්ධි පරීක්ෂණය | පැය 01 | 100 | 40 |
| 2. විෂයානුබද්ධ තාක්ෂණික පරීක්ෂණය | පැය 03 | 100 | 40 |

8.1. විභාගය සඳහා වන විෂය නිර්දේශය :

1. බුද්ධි පරීක්ෂණය (සෑම තනතුරක් සඳහාම පොදු වේ)

| *ප්‍රශ්න පත්‍රයේ නම* | *විෂය නිර්දේශය* |
|---|---|
| බුද්ධි පරීක්ෂණය | අපේක්ෂකයාගේ සිතීමේ තර්කානුකූලභාවයත් සිතීමේ විශ්ලේෂණ තත්ත්වයත් තීරණය කිරීමේ ශක්තියත් විනිශ්චය කිරීම සඳහා වූ ප්‍රශ්නවලින් යුක්ත වේ. |

2. විෂයානුබද්ධ තාක්ෂණික පරීක්ෂණය

- සැලසුම් ශිල්පී තනතුර සඳහා

| *ප්‍රශ්න පත්‍රයේ නම* | *විෂය නිර්දේශය* |
|---|---|
| විෂයානුබද්ධ තාක්ෂණික පරීක්ෂණය | දෙන ලද නිර්මිතයක ප්‍රමාණය ගණනය කිරීම සහ ඉදිකිරීම් ද්‍රව්‍යවල ගුණාත්මක ස්වභාවය පිළිබඳ දැනුම පරීක්ෂා කිරීම සහ ඇඳීමේ මූලධර්ම පාවිච්චි කර දෙන ලද සටහන් අනුව වස්තුවක හෝ කොටසක හරස්කඩක් සහ පෙර හෝ පසු පෙනුමක් ඇඳීම. |

- සිවිල් ඉංජිනේරුමය ද්‍රව්‍ය සමීක්ෂක/විදුම් සහකාර/පර්යේෂණ සහකාර (ඉංජිනේරුමය ද්‍රව්‍ය)/පර්යේෂණ සහකාර (ජල ශක්ති)/පාංශු ප්‍රස්ථාරක තනතුරු සඳහා

| *ප්‍රශ්න පත්‍රයේ නම* | *විෂය නිර්දේශය* |
|---|---|
| විෂයානුබද්ධ තාක්ෂණික පරීක්ෂණය | වීජ ගණිතය, ජ්‍යාමිතිය, ත්‍රිකෝණමිතිය, ද්‍රව සහ ද්‍රවවල භෞතික ගුණ, ද්‍රවස්ථිති විද්‍යාව, මිනුම් ඒකක, පරිමාණ සිතියම් කියවීම, විද්‍යාත්මක ගණනය කිරීම ආදී විෂයයන් පිළිබඳ දැනුම පරීක්ෂා කිරීම සඳහා වූ ප්‍රශ්නවලින් මෙම ප්‍රශ්න පත්‍රය සමන්විත වේ. |

- පස් සමීක්ෂක /පර්යේෂණ සහකාර (සාමාන්‍ය) තනතුර සඳහා

| *ප්‍රශ්න පත්‍රයේ නම* | *විෂය නිර්දේශය* |
|---|---|
| විෂයානුබද්ධ තාක්ෂණික පරීක්ෂණය | I කොටස (භෞතික විද්‍යාව)<br><br>a) ආලෝකය<br>b) තාපය<br>c) යන්ත්‍ර විද්‍යාව<br>d) විද්‍යුතය හා චුම්භකත්වය<br><br>II කොටස (රසායන විද්‍යාව)<br><br>a) කාබනික රසායනය<br>b) ප්‍රමාණාත්මක හා ගුණාත්මක විශ්ලේෂණය<br>c) අකාබනික රසායනය<br>d) සාමාන්‍ය රසායන විද්‍යාව |

- ජල විද්‍යා ක්ෂේත්‍ර සහකාර /ජල විද්‍යා සහකාර තනතුර සඳහා

| *ප්‍රශ්න පත්‍රයේ නම* | *විෂය නිර්දේශය* |
|---|---|
| විෂයානුබද්ධ තාක්ෂණික පරීක්ෂණය | ඛණ්ඩාංක ජ්‍යාමිතිය, ගති විද්‍යාව, ස්ථිති විද්‍යාව, ත්‍රිකෝණමිතිය, ද්‍රවස්ථිති විද්‍යාව, සංඛ්‍යානය, යාන්ත්‍ර විද්‍යාව, ආලෝකය (වර්තනය සහ පරාවර්තනය පිළිබඳ නියමයන්) තාපය, ආර්ද්‍රතාව, විදුලිය, ඉලෙක්ට්‍රොනික විද්‍යාව ආදී විෂයයන් පිළිබඳ දැනුම පරීක්ෂා කිරීම සඳහා වූ ප්‍රශ්නවලින් මෙම ප්‍රශ්න පත්‍රය සමන්විත වේ. |

- යාන්ත්‍රික මූලික තනතුර සඳහා

| *ප්‍රශ්න පත්‍රයේ නම* | *විෂය නිර්දේශය* |
|---|---|
| විෂයානුබද්ධ තාක්ෂණික පරීක්ෂණය | ඇඳීමේ මූලධර්ම පාවිච්චි කරගෙන දෙන ලද රූපසටහන් අනුව යන්ත්‍රයක හෝ කොටසක හරස්කඩක් හෝ පෙර හෝ පසු පෙනීමක් ඇඳීම සහ භෞතික විද්‍යාව, යාන්ත්‍රික විද්‍යාව හා ව්‍යවහාරික ගණිතය යන විෂයයන් පිළිබඳ අයදුම්කරුවන්ගේ දැනුම පරීක්ෂා කිරීම සඳහා ප්‍රශ්න පත්‍ර පිළියෙල කරනු ලැබේ. |

9. අයදුම් කිරීමේ ක්‍රමය:

9.1 මාර්ගගත (Online) විභාග අයදුම්පත ඉංග්‍රීසි භාෂාවෙන් පමණක් සම්පූර්ණ කළ යුතුය. අයදුම්කරු විසින් මාර්ගගතව යොමු කරන ලද මෘදු පිටපත් හා වලංගු අයදුම්පතක් බවට දෙපාර්තමේන්තුව විසින් භාර ගන්නා ලද බව / භාර නොගන්නා

බව පද්ධතියට ප්‍රවේශ වීමට භාවිතා කරන ලද ජංගම දුරකථන අංකයට කෙටි පණිවුඩයක් (SMS) මගින් හෝ විද්‍යුත් තැපැල් (E-Mail) ලිපිනයට හෝ දැනුම් දෙනු ලැබේ. මාර්ගගත අයදුම්පත සම්පූර්ණ කිරීමට පෙර විභාගය සඳහා අයදුම් කිරීම වෙනුවෙන් සකසා ඇති උපදෙස් පත්‍රිකාව (Instructions) බාගත කර ගන්න. අයදුම්පත පිරවීමේ දී එම උපදෙස් තරයේ පිළිපදින්න. අයදුම්පතේ මුද්‍රිත පිටපතක් ලබා ගැනීමෙන් පසුව එහි සිදු කරනු ලබන කිසිදු සංශෝධනයක් වලංගු සංශෝධනයක් ලෙස සලකනු නොලැබේ. අසම්පූර්ණ අයදුම්පත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

9.2 අයදුම් කිරීමට අපේක්ෂා කරනු ලබන්නේ ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ ඉහත කුමන තනතුරට ද යන්න අදාළ ස්ථානයෙහි (√) සලකුණ මඟින් පැහැදිලිව සලකුණු කිරීම අනිවාර්ය වේ. යම් අයදුම්කරුවකු තනතුරු කිහිපයක් සඳහා අයදුම් කරන්නේ නම් ප්‍රමුඛතාවය අනුව පිළිවෙළ සඳහන් කළ යුතු වේ. එක් අයදුම්කරුවකුට අයදුම් කළ හැකි උපරිම තනතුරු සංඛ්‍යාව තුනකි (03).

9.3 අයදුම්කරු විභාග ප්‍රවේශ පත්‍රයේ තම අත්සන සහතික කරවා ගත යුතු අතර විභාග දිනයේ ශාලාධිපතිවරයා වෙත ඉදිරිපත් කළ යුත්තේ එසේ අත්සන සහතික කරවා ගත් ප්‍රවේශ පත්‍රයයි. අත්සන සහතික කරවා ගත් ප්‍රවේශ පත්‍රයක් නොමැතිව විභාගයට පෙනී සිටීමට අවසර ලබා දෙනු නොලැබේ.

9.4 *ගැසට්* නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම් කර ඇතැයි යන පූර්ව නිගමනය මත අයදුම්පත් භාරගන්නා අවසාන දිනට හෝ එදිනට පෙර නියමිත විභාග ගාස්තුව ගෙවා සම්පූර්ණ කරන ලද අයදුම්පත් යොමු කර ඇති අයදුම්කරුවන් වෙත විභාග කොමසාරිස් ජනරාල් විසින් විභාග ප්‍රවේශ පත්‍ර මාර්ගගතව පමණක් නිකුත් කරනු ඇත. විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් ඒ බව සඳහන් කරමින් වෙබ් නිවේදනයක් මඟින් අයදුම්කරුවන් වෙත කෙටි පණිවුඩයක් මඟින් දන්වනු ලැබේ. තම ප්‍රවේශ පත්‍රය නොලද අපේක්ෂකයකු වේ නම් දැන්වීමේ සඳහන් පරිදි ඒ පිළිබඳව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ ආයතනික විභාග සංවිධාන ශාඛාවෙන් විමසිය යුතු ය. එසේ විමසීමේ දී අයදුම්කරු තමා ඉල්ලුම් කරන ලද විභාගයේ නම, අයදුම්කරුගේ සම්පූර්ණ නම, ජාතික හැඳුනුම්පත් අංකය සහ ලිපිනය නිවැරදිව සඳහන් කළ ඉල්ලීම් ලිපියක් දැන්වීමේ සඳහන් විද්‍යුත් තැපැල් ලිපිනය වෙත යොමු කර විමසා සිටීම වඩාත් ඵලදායී වනු ඇත. එසේ විමසීමේ දී විභාග දෙපාර්තමේන්තුව විසින් විමසා සිටින කිසියම් තොරතුරක් සනාථ කිරීම සඳහා අයදුම්කරු විසින් ළඟ තබා ගත් අයදුම්පතේ පිටපත, විභාග ගාස්තු ගෙවීමෙන් ලද ලදුපතේ පිටපත ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

9.5 අපේක්ෂකයකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත් කිරීමට හෝ තනතුර සඳහා සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැලකිය යුතු වේ.

9.6 ප්‍රවේශ පත්‍රය පරීක්ෂා කර බලා සංශෝධන වේනොත් කල්වේලා ඇතිව විභාග දෙපාර්තමේන්තුව අමතා අයදුම්පතට අනුව අදාළ සංශෝධන සිදු කරගත යුතු ය. විභාග ශාලාවේ දී සංශෝධන සඳහා කරනු ලබන ඉල්ලීම් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

9.7 සියලුම අයදුම්කරුවන් මෙම ගැසට් පත්‍රයේ සඳහන් පොදු විභාග නීති රීති අනුව කටයුතු කිරීමට බැඳී සිටිනු ඇත.

10. විභාග ගාස්තු

❖ **විභාග ගාස්තුව රු. 1,200/- කි**. විභාග ගාස්තු ගෙවීමේදී මාර්ගගත පද්ධතියෙන් ලබා දෙන පහත සඳහන් ගාස්තු ගෙවීමේ ක්‍රමවේද යටතේ පමණක් ගෙවීම් සිදු කළ යුතු ය.

i. ඕනෑම බැංකු ණය කාඩ්පතක් මඟින් (Any Bank Credit Card);
ii. අන්තර්ජාල ගෙවීම් පහසුකම් සහිත ඕනෑම බැංකු හර කාඩ්පතක් මඟින් (Any Bank Debit Card with the facility of internet transactions);
iii. ලංකා බැංකු ඔන්ලයින් බැංකු ක්‍රමය මඟින් (Online Banking Method of Bank of Ceylon);
iv. ඕනෑම ලංකා බැංකු ශාඛාවක් මඟින් (Any Branch of the Bank Of Ceylon).

*සටහන-*

(*අ*) ඉහත ක්‍රම මඟින් ගෙවීම සිදු කරන ආකාරය පිළිබඳ උපදෙස් වෙබ් අඩවියේ විභාගයට අදාළ තාක්ෂණික උපදෙස් යටතේ පළ කර ඇත.

(*ආ*) ගෙවීම් ලැබුණු බවට කෙටි පණිවුඩයක් (SMS) මඟින් හෝ විද්‍යුත් තැපැල් පණිවුඩයක් මඟින් හෝ දන්වනු ලැබේ. විභාග ගාස්තුව සඳහා වන සම්පූර්ණ මුදලම ගෙවිය යුතු වන අතර, විභාග ගාස්තු අඩුවෙන් හෝ වැඩියෙන් ගෙවා ඇති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. ඉහත සඳහන් ගෙවීම් ක්‍රම මඟින් විභාග ගාස්තු

ගෙවීමේදී සිදු වන දෝෂ සම්බන්ධයෙන් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වග කියනු නොලැබේ.

(ඇ) විභාගය සඳහා ගෙවන ලද මුදල කිසිදු හේතුවක් නිසා ආපසු ගෙවීමක් හෝ වෙනත් විභාගයක් සඳහා මාරු කිරීමක් හෝ සිදු කරනු නොලැබේ.

11. අපේක්ෂකයන්ගේ අනන්‍යතාව:

11.1 විභාග අපේක්ෂක/ අපේක්ෂිකාවන් විභාග ශාලාව තුළ දී තමන් පෙනී සිටින සෑම විෂයයක් සඳහාම ශාලාධිපතිවරයා සෑහිමකට පත් වන පරිදි ස්වකීය අනන්‍යතාව සනාථ කළ යුතු ය. ඒ සඳහා පහත දැක්වෙන ලේඛන පමණක් වලංගු වේ.

i. ජාතික හැඳුනුම්පත;
ii. වලංගු විදේශ ගමන් බලපත්‍රය;
iii. වලංගු ශ්‍රී ලාංකික රියදුරු බලපත්‍රය.

එසේම විභාග අපේක්ෂකයන් අනන්‍යතාව හා විද්‍යුත් සන්නිවේදන උපාංග පැළඳගෙන නොමැති බව සනාථ කරගත හැකි වන පරිදි මුහුණ සහ දෙකන් ආවරණය කිරීමෙන් තොරව විභාග ශාලාවට ඇතුළු විය යුතු ය. එසේ තම අනන්‍යතාව සනාථ කිරීම ප්‍රතික්ෂේප කරන අයදුම්කරුවන් විභාග ශාලාවට ඇතුළත් කරගනු නොලැබේ. තව ද, විභාග ශාලාවට ඇතුළත් වූ මොහොතේ සිට විභාගය අවසන් වී ඉන් පිටවන තෙක් මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව සිටිය යුතු ය.

12. සාවද්‍ය තොරතුරු සැපයීමට දඬුවම් :

12.1 අපේක්ෂකයකුට අවශ්‍ය සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් විභාගයට කලින් හෝ විභාගය පවත්වන කාලයේ දී හෝ විභාගයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවකදී ඔහුගේ / ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කෙරේ. අපේක්ෂකයකු ඉදිරිපත් කර ඇති කිසියම් කරුණක් සාවද්‍ය බව දැන දැනම ඉදිරිපත් කර ඇති බව හෙළිවුවහොත්, එසේ නැත්නම් යම් වැදගත් කරුණක් ඔහු / ඇය ඕනෑකමින් යටපත් කර ඇත්නම් ඔහු / ඇය රජයේ සේවයෙන් පහ කිරීමට කටයුතු කෙරේ.

13. පොදු කරුණු:

13.1 විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීති රීතිවලට විභාග අපේක්ෂකයන් යටත් වේ. එම නීති රීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත්වීමට ඔහුට හෝ ඇයට සිදුවේ. විභාග ප්‍රතිඵල සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල්ගේ තීරණ අවසන් තීරණය වේ.

13.2 මෙහි සඳහන් නොවන යම් කරුණක් වේතොත් ඒ පිළිබඳව හා මෙම පුරප්පාඩු පිරවීම සම්බන්ධව රාජ්‍ය සේවා කොමිෂන් සභාව හා වාරිමාර්ග අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් තීරණය කරනු ඇත.

13.3 සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂාවලින් පළකරන මෙම නිවේදනයේ භාෂා පාඨ අතර අනනුකූලතාවක් ඇති වුවහොත් සිංහල භාෂා මාධ්‍ය නිවේදනය නිවැරදි සේ සලකා කටයුතු කරනු ලැබේ.

ආචාර්ය. (ඉංජි.) **කිත්සිරි වැලිගෙපොලගේ,**
වාරිමාර්ග අධ්‍යක්ෂ ජනරාල්,
වාරිමාර්ග දෙපාර්තමේන්තුව.

2026 ජුලි මස 13 වැනි දින,
වාරිමාර්ග දෙපාර්තමේන්තුව.
කොළඹ 07.

07 - 380

Teachmore.lk